[දසවැනි පාර්ලිමේන්තුව (පළමුවැනි සභාවාරය) - පළමුවැනි රැස්වීම]

අංක 1.]

# පාර්ලිමේන්තුවේ වැඩ පිළිවෙළ

**2024 නොවැම්බර් 21 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 ට**

---

**1. රැස්වීම කැඳවීම පිළිබඳ ගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශන පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවීම.**

**2. කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත් කිරීම:**

(පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 4)

"4. කථානායකවරයකු තෝරා පත්කර ගනු ලැබීමේ කාර්ය පටිපාටිය මතු සඳහන් පරිදි විය යුත්තේ ය :—

(අ) කථානායකවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කිරීමට රිසි යම් මන්ත්‍රීවරයකු, අදාළ මන්ත්‍රීවරයා එසේ තෝරා පත්කර ගනු ලැබුවහොත් කථානායකවරයා ලෙස සේවය කිරීමට එකී මන්ත්‍රීවරයා රිසි ද යන්න එකී මන්ත්‍රීවරයාගෙන් ම කලින් විමසා දැනගනු ලැබිය යුත්තේ ය.

(ආ) යම් මන්ත්‍රීවරයකු විසින්, මහ ලේකම්වරයා අමතමින්, එම අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ සිටින වෙනත් යම් මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ කථානායක ධුරයට යෝජනා කරමින් එම මන්ත්‍රීවරයා කථානායකවරයා වශයෙන් මෙම පාර්ලිමේන්තුවේ මූලාසනාරූඪ විය යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම යෝජනාව ස්ථිර කරනු ලැබිය යුත්තේ ය. එහෙත් ඒ පිළිබඳව විවාදයකට ඉඩ දෙනු නොලැබිය යුත්තේ ය.

(ඇ) කථානායකවරයා වශයෙන් එසේ යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලබනුයේ එක් මන්ත්‍රීවරයකු පමණක් නම්, එම මන්ත්‍රීවරයා කථානායකවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ බව මහ ලේකම්වරයා විසින් ප්‍රශ්නය නොවිමසා ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ ය. එක් මන්ත්‍රීවරයකුට වැඩි ගණනක් එසේ යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලැබ ඇත්නම්, පාර්ලිමේන්තුව විසින් බෙදුම් සීනු මිනිත්තු පහක් නාද කිරීමෙන් අනතුරුව රහස් ඡන්දයෙන් කථානායකවරයකු තෝරා පත්කර ගැනීමට කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(ඈ) ඡන්දය පැවැත්වීමේ කාර්යය සඳහා, මහ ලේකම්වරයා විසින් පැමිණ සිටින එක් එක් මන්ත්‍රීවරයාට, ඡන්ද පත්‍රිකාව බැගින් දෙනු ලැබිය යුතු අතර, එම මන්ත්‍රීවරයා විසින් තමා ඡන්දය දීමට රිසි මන්ත්‍රීවරයාගේ නම එම ඡන්ද පත්‍රිකාව මත ලියනු ලැබ, එසේ ලියන ලද නම නොපෙනෙන ආකාරයට ඡන්ද පත්‍රිකාව නවනු ලැබිය යුතු අතර, ස්වකීය අත්සන ද එම ඡන්ද පත්‍රිකාවේ තබනු ලැබිය යුත්තේ ය.

(ඉ) මහ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ඡන්ද පත්‍රිකා එකතු කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුවේ සභාමේසය මත දී මහ ලේකම්වරයා විසින් ඒවා ගණන් කිරීම සිදු කරනු ලැබිය යුත්තේ ය. ඡන්ද විමසීමේ ප්‍රතිඵලය මහ ලේකම්වරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ ය.

(ඊ) (i) අපේක්ෂකයන් දෙදෙනෙකුට වැඩි ගණනකගේ නම් යෝජනා කරනු ලැබ ඇති අවස්ථාවක දී, පළමුවැනි ඡන්ද විමසීමේ දී එක් අපේක්ෂකයකුටවත් අනෙක් අපේක්ෂකයන් සියල්ලන්ටම ලැබී තිබෙන මුළු ඡන්ද ගණනට වැඩි ඡන්ද ගණනක් ලැබී නොමැති නම්, ඡන්ද අඩුම ගණන ලබා ගත් අපේක්ෂකයා ඡන්ද විමසීමෙන් බැහැර කොට ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම ඉදිරියට කරගෙන යනු ලැබිය යුත්තේ ය. ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන සැම ඡන්ද විමසීම් වාරයක දී ම අඩුම ඡන්ද ගණන ලබා ගන්නා අපේක්ෂකයා බැහැර කරමින් එක් අපේක්ෂකයකු, ඉතිරි වී සිටින අනික් අපේක්ෂකයා ලබා ඇති ඡන්ද ගණනට හෝ ඉතිරි වී සිටින අනෙක් අපේක්ෂකයන් ලබා ඇති මුළු ඡන්ද ගණනට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා තෙක්, අවස්ථානුකූලව, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම කරනු ලැබිය යුත්තේ ය.

(ii) අපේක්ෂකයන් තිදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අතර ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වනු ලබන ඡන්ද විමසීමකින් අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු එක සමාන ඡන්ද ගණනක් ලැබ සිටින අවස්ථාවක දී මෙහි (i) අනු ඡේදය යටතේ ඉන් එක් අපේක්ෂකයකු ඡන්ද විමසීමෙන් බැහැර කරනු ලැබිය යුතු විට, එක සමාන ඡන්ද ගණනක් ලබා ගත් අපේක්ෂකයන් අතරින් බැහැර කරනු ලැබිය යුතු අපේක්ෂකයා තෝරා ගැනීම මහ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන අන්දමට කුසපත් ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(iii) අපේක්ෂකයන් දෙදෙනෙකු අතර ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන ඡන්ද විමසීමක දී ඡන්ද ගණන සමාන වන අවස්ථාවක දී, නැවත ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්දය විමසනු ලැබිය යුතු අතර, එම නැවත ඡන්දය විමසීමේ දී ද ඡන්ද ගණන සමාන වුවහොත්, ඡන්ද විමසීමෙන් බැහැර කරනු ලැබිය යුතු අපේක්ෂකයා තෝරා ගැනීම මහ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකට කුසපත් ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(උ) ඡන්ද පත්‍රිකා ගණන් කරන අතර ම ඒවා පෙට්ටියක තැන්පත් කරනු ලැබිය යුත්තේ ය. තව ද මන්ත්‍රීවරයකු කථානායකවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබූ විට, පාර්ලිමේන්තුව ඉදිරිපිට දී පෙට්ටියට මුද්‍රා තබනු ලැබ එය එක් ලිත් මාසයක් මහ ලේකම්වරයාගේ භාරයෙහි තබනු ලැබිය යුත්තේ ය. ඉන් පසු මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවෙන් ලැබිය හැකි යම් නියමයකට යටත්ව, එම ඡන්ද පත්‍රිකා විනාශ කරනු ලැබ, එසේ කළ බව පාර්ලිමේන්තුවට සහතික කර දැනුම් දෙනු ලැබිය යුත්තේ ය.”

**3. නිල ප්‍රතිඥාව හෝ දිවුරුම:**

(පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 5)

“5. (1) කථානායකවරයා විසින් නිල ප්‍රතිඥාව හෝ දිවුරුම ලබා දීමෙන් අනතුරුව පැමිණ සිටින මන්ත්‍රීවරයන් සියල්ලන්ම ලවා ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම සහ අත්සන් තැබීම කරවීමට සලස්වනු ලැබිය යුත්තේ ය. ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම මහ ලේකම්වරයා විසින් කරවනු ලැබිය යුත්තේ ය.

(2) කථානායකවරයා විසින් ආරම්භ කරනු ලබමින් සෑම මන්ත්‍රීවරයකු විසින් ම ප්‍රතිඥාව දීම හෝ දිවුරුම දීම සිදු කරනු ලැබූ වහා ම මහ ලේකම්වරයා විසින් තත් කාර්යය සඳහා තබා ඇති මන්ත්‍රී නාම ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුත්තේ ය.

(3) පාර්ලිමේන්තුව රැස්වන කවර හෝ දිනයක ඊට පෙර නිල ප්‍රතිඥාව දීම හෝ දිවුරුම දීම සිදුකරනු නොලැබූ මන්ත්‍රීවරයකුට 22 ස්ථාවර නියෝගය යටතේ නියම කරනු ලබන වේලාවට පාර්ලිමේන්තු සභා මේසය වෙත පැමිණ ඒ සම්බන්ධයෙන් මහ ලේකම්වරයාට දැනුම් දෙනු ලැබිය හැකි අතර, එවිට, මහ ලේකම්වරයා විසින්, එම මන්ත්‍රීවරයා ලවා නිල ප්‍රතිඥාව දීම හෝ දිවුරුම දීම කරවනු ලැබිය යුතු අතර, ඉන් පසු එම මන්ත්‍රීවරයා විසින් මන්ත්‍රී නාම ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුත්තේ ය.”

**4. නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත් කිරීම:**

(පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 6(2))

“6. (2) නියෝජ්‍ය කථානායකවරයකු සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයකු තෝරා පත්කර ගනු ලැබීමේ කාර්ය පටිපාටිය එම ඡන්ද විමසීම් කථානායකවරයා විසින් පවත්වනු ලැබිය යුතු බව හැර, කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමේ දී අනුගමනය කරනු ලබන කාර්ය පටිපාටියට හැකි තරම් සමාන විය යුත්තේ ය.”

**5. නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත් කිරීම:**

(පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 6(2))

**6. ජනාධිපතිතුමාගෙන් ලත් සංදේශ:**

***ගරු ජනාධිපතිතුමා සභා ගර්භයට සම්ප්‍රාප්තවීමෙන් පසුව පාර්ලිමේන්තුව යළි රැස්වූ විට සභාවේ වැඩ පිළිවෙළ මෙසේය:—***

**7. ගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව ඇමතීම.**

**8. යෝජනා පිළිබඳ දැනුම්දීම:**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2024 දෙසැම්බර් 03 අඟහරුවාදා පූ. භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය.

**9. පාර්ලිමේන්තුව කල් තැබීම.**